# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,497 - 2026 ජූලි මස 10 සිකුරාදා - 2026.07.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

# II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 170 |
| බුද්දල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූලි මස 31 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජූලි මස 17 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම

## අවිස්සාවේල්ල දිසා අධිකරණය

### පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ. පෙ. 2085,
කොළඹ 02.

අවිස්සාවේල්ල දිසා අධිකරණ
නඩු අංක : 28263/M

*............පැමිණිලිකරු.*

අවිස්සාවේල්ල දිසා අධිකරණ
ඇස්කිසි අංක :

*එදිරිව*

1. අතුකෝරලගේ ඉරානි ශාලිකා,
   අංක 185, වලව්ට, ගැටහැත්ත.

*නව ලිපිනය :*

අංක 45/122, රත්නපුර පාර, දියහොඳ වත්ත, අවිස්සාවේල්ල.

2. ලියනගේ කාලිංග පේමචන්ද්‍ර,
   අංක 185, වලව්ට, ගැටහැත්ත.

*නව ලිපිනය :*

අංක 45/122, රත්නපුර පාර, දියහොඳ වත්ත, අවිස්සාවේල්ල.

*..........විත්තිකරුවන්.*

වර්ෂ 2025 ක් වූ මාර්තු මස 11 දින ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය ප්‍රකාරව පැමිණිලිකාර බැංකුවට පළමු සහ දෙවන විත්තිකරුවන්ගෙන් රුපියල් තිස් අට ලක්ෂ දොළොස් දහස් තුන්සිය දාහතරයි ශත අසූ හතරක (රු. 3,812,314.84) මුදලක් ද, රුපියල් විසි අට දහස් හයසිය හැට නවයයි ශත දෙකක (රු. 28,669.02) මුදලක් ද, රුපියල් දෙලක්ෂ අසූ දහස් දෙසිය එකොළහයි ශත විසි හයක මුදලක් ද, (රු. 280,211.26) එම සම්පූර්ණ මුදල වන රුපියල් හතලිස් එක් ලක්ෂ විසි එක් දහස් එකසිය අනූ පහයි ශත දොළහක (රු. 4,121,195.12) මුදල මත පැමිණිල්ලේ දින සිට තීන්දු ප්‍රකාශිත දින තෙක් 17.5% ක වාර්ෂික පොලියක් ද, ඉන් අනතුරුව සම්පූර්ණ මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් සම්පූර්ණ මුදල මත නෛතික පොළිය ද, වෙන්දේසි ගාස්තු ද අයකර ගැනීම සඳහා ඉහත නම් සඳහන් විත්තිකරුවන්ට අයත් මා විසින් තහනමට ගනු ලැබූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ සම්බන්ධයෙන් ඔවුන්ට අයත් සියලු අයිතිවාසිකම් හා හිමිකම් වර්ෂ 2026 ක් වූ අගෝස්තු මස 06 දින එම දේපළ පිහිටි ස්ථානයේ දී පෙ. ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, උඩුගහපත්තුවේ, සීතාවකපුර නගර සභා සීමාවේ හා හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 432 D දරන කොටහැර ග්‍රාම නිලධාරී වසමට අයත් අවිස්සාවේල්ල ග්‍රාමයෙහි වරිපනම් අංක 122/40, රත්නපුර පාරේ පිහිටි "හුස්සෙනි වත්ත *නොහොත්* දියහොඳ වත්ත (කොටසක්)" නැමති ඉඩමට 2013.11.21 දින ආර්. ඒ. ඩී. එල්. විජේවර්ධන මානකතැන විසින් මැන සම්පාදිත අංක 2013/200 පිඹුර ප්‍රකාර කබැලි අක්ෂර A දරන ඉඩමට මායිම්, උතුරට : අංක 2962 පිඹුරේ කැබලි අංක 16 ද, නැගෙනහිරට : අංක 2962 පිඹුරේ කැබලි අංක 11 ද, දකුණට : පාර (නගර සභා) - අංක 2962 පිඹුරේ කැබලි අක්ෂර D ( මීටර් 6.0 පළල) ද, බස්නාහිරට : අගල (නගර සභා) අංක 2962 පිඹුරේ කැබලි අංක 13 (මීටර් 1.0 පළල) යන මායිම් තුළ පිහිටි පර්චස් දහතුනයි දශම හතරයි බිංදුවක් (පර්. 13.40) ක වපසරියකින් යුතු මෙම ඉඩම ගොඩනැගිල්ල හා ඊට අයත් සියළු දේ ද සමග වේ.

මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 49/129 හි ලියාපදිංචි කර ඇත.

තව ද, ඉහත කී පිඹුරු අංක 2013/200 හි පාරවල් සඳහා වෙන් කර ඇති නගර සභා පාර සහ 1995.07.01 දින එම්. ඩී. පියසිරි මානකතැන විසින් මැන සම්පාදිත අංක 2962 පිඹුර ප්‍රකාර කැබලි අක්ෂර D (පාරට වෙන් කරන ලද) යන ඉඩම් කැබලි පොදුවේ පාරවල් වශයෙන් පාවිච්චි කිරීමේ මාර්ග අයිතිවාසිකම් ද සමග වේ.

අධිකරණයේ අණ පරිදි,

එම්. ඒ. ඒ. එන්. කුමාරි,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
අවිස්සාවේල්ල.

07-114